සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් හඳුනාගත හැකි දිවි තොරකරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීම ඔස්සේ ඒ සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීමේ හැකියාව ලැබෙනු ඇත. කෙසේ නමුත්, එවැනි වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී ප්‍රවේසම් සහගත වීම සහ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වීම අත්‍යාවශ්‍ය වේ. මන්දයත්, අනුකාරක දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බැවිනි.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, දිවි තොර කරගත් ආකාරය ඉදිරිපත් කිරීම හෝ එවැනි ක්‍රම දැක්වෙන ග්‍රැෆික් සටහන් ඉදිරිපත් කිරීම ඔස්සේ, අනුකාරක දිවි තොර කරගැනීම් ඇතිවීමට ඇති හැකියාව නොසලකා හැරිය නොහැක. එසේම දිවි තොර කරගැනීමක් පිළිබඳ භාවාතිෂය අයුරින් ඉදිරිපත් කිරීම ඔස්සේ, එය අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයන් වීමට ඉඩ ඇත.

එසේම දිවි තොරකරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් සමගින් සෑමවිටම හදිසි උපකාරක අංක පළ කරන ලෙසින් මාධ්‍ය දිරිමත් කෙරේ. මන්දයත්, හදිසි උපකාරක අංකයක් පළ කිරීම ඔස්සේ දිවි තොරකරගැනීමේ නැඹුරුවෙන් යුතු අයෙකුගේ දිවි බේරාගැනීමට අවස්ථාවක් ලැබීමයි.

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**